**නාමල්ඔය ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 04 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2010 ජූලි 20 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම් හැර 2010 දෙසැම්බර් 31 දිනට නාමල්ඔය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) 2010 වර්ෂයේ දී කැබ් රථය අළුත්වැඩියාව වෙනුවෙන් දරණ ලද රු.1,439,620 වියදම හා ඒ සඳහා පළාත් සභාවෙන් ලද ආධාර මුදල ගිණුම්ගත කර නොතිබුණි

(ආ) ප්‍රාග්ධන ආධාර හා ප්‍රාග්ධන වියදම් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

2010 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ස්ථාවර වත්කම්වල අගය වූ රු.4,968,922 ක් සනාථකර ගැනීම සඳහා භාණ්ඩ සමීක්ෂණ වාර්තා හා ස්ථාවර වත්කම් ලේඛණය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

1.3.3 **අනුකූල නොවීම්**

පහත දැක්වෙන නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීතිරීති රෙගුලාසි ආදියට යොමුව** | **අනුකූල නොවීම්** |
|---|---|
| **(ආ) 1988 ප්‍රාදේශීය සභා ( මූල්‍ය හා පරිපාලන )** | |
| (i) රීති 17 | මිළදී ගන්නා ලද ලදු පොත් සම්බන්ධයෙන් විධිමත් අධීක්ෂණයකින් කටයුතු කර නොතිබුණි. |
| (ii) රීති 99 | සමාලෝචිත වර්ෂයට අදාල රු.810,978 ක් වටිනා ගෙවීම් වවුචර් සභාපති හෝ උප සභාපති විසින් සහතික කර තිබුණි. |
| (iii) රීති 195, 196, 197, | පරිභෝජන භාණ්ඩ ලේඛණයක් පවත්වා නොතිබුණි. |
| (iv) රීති 180 | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියා කරන නිලධාරීන් හෝ ආදායම් එකතු කිරීම් කටයුතු සම්බන්ධ නිලධාරීන්ගෙන් ඇප ලබාගෙන නොතිබුණි. |
| (ආ) **ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි** | |
| මුදල් රෙගුලාසි 751 | මිළට ගන්නා ලද ද්‍රව්‍ය තොග ලේඛණ වල සටහන් කර නොතිබුණි. |

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.137,230 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.66,347 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදයම් හා හිඟ ආදායම්**

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට සහ ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2010 ඇස්තමේන්තුගත | 2010 තථ්‍ය | 2010 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | 2009 ඇස්තමේන්තුගත | 2009 තථ්‍ය | 2009 දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' |
| i. බදු කුලී | 368.6 | 366.8 | 1.8 | 374 | 354 | 162 |
| ii. බලපත්‍ර ගාස්තු | 277.3 | 178.4 | 98.8 | 268 | 76 | 267 |
| iii.වෙනත් ආදායම් | 703.1 | 515.8 | 187.2 | 869 | 394 | 481 |

**2.2.2 උසාවි දඩ මුදල්**

2010 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.629,687 ක් ලැබිය යුතුව තිබුණි.

**2.2.3 බදු කුලී**

2010 දෙසැම්බර් 31 දින වන විට අයවිය යුතුව තිබූ රු.100,583 ක් වූ බදු කුලී ආදායම් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 වියදම් ව්‍යුහය**

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම්, විචලනයන්ද සමග පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 අයවැයගත | 2010 තථ්‍ය | 2010 විචලනය | 2009 අයවැයගත | 2009 තථ්‍ය | 2009 විචලනය |
|---|---|---|---|---|---|---|
| | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' | රු. '000' |
| **පුනරාවර්තන වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 4,650 | 5,109 | (459) | 4,247 | 4,873 | (626) |
| අනෙකුත් | 978 | 1,002 | (24) | 1,119 | 965 | 154 |
| උප එකතුව | 5,628 | 6,111 | (483) | 5,366 | 5,838 | (472) |
| ප්‍රාග්ධන වියදම් | 5 | 64 | (59) | 5 | 71 | (66) |
| මුළු එකතුව | **5,633** | **6,175** | **(542)** | **5,371** | **5,909** | **(538)** |

**2.4 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| සේවක ශ්‍රේණිය | 2010 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|
| | අනුමත | තථ්‍ය |
| මාණ්ඩලික | 01 | 01 |
| ද්විතීයික | 09 | 08 |
| ප්‍රාථමික | 10 | 08 |
| වෙනත් (අනියම්, තාවකාලික) | - | 01 |
| | 20 | 18 |

**2.5 වත්කම් කළමනාකරණය**

**2.5.1 නිශ්කාර්ය /උනා උපයෝජිත සම්පත්**

රු. 312,500 ක අගයකට වූ වාහනයක් වසර 05 ක සිට නිශ්කාර්යව පැවතුණි

**2.5.2 අයවීමට ඇති සේවක ණය**

2010 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා අයවිය යුතුව තිබූ සේවක ණය අත්තිකාරම් ශේෂවල එකතුව රු. 446,816 ක් විය.

**2.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2004 ජූනි මාසයේදී රු.195,040 ක් වැය කර පරගහකැලේ ප්‍රදේශයේ නව ජල ව්‍යාපෘතියක් සඳහා පොම්පාගාරයක් සහ නල මාර්ගයක් ඉදිකර තිබුණ ද ඒ සඳහා විදුලිය සහ ජල මෝටරයක් සපයා නොතිබීම නිසා මේ දක්වා එයින් අපේක්ෂිත ප්‍රතිඵල ලැබී නොතිබුණි.

(ආ) පරිගණක යන්ත්‍රයක්, ස්කෑනර් යන්ත්‍රයක් හා මුද්‍රණ යන්ත්‍ර 02 ක් භෞතික පරීක්ෂණයට ඉදිරිපත්කර නොතිබුණි.

(ඇ) පොල්වත්ත ප්‍රදේශයේ නල ජල ව්‍යාපෘතිය 2003 වර්ෂයේදී ආරම්භ කර රු. 200,428 ක වියදමින් ළිඳක් හා පොම්පාගාරයක් ඉදිකර තිබුණ ද සැලසුම් ප්‍රකාරව ජල ටැංකිය ඉදිකිරීම හා අනෙකුත් කටයුතු මේ දක්වා සම්පූර්ණ කර නොතිබුණි.

(ඈ) 2010 වර්ෂයේ දී කර්මාන්ත ගෙවීම් වලට අදාල රු.38,975 ක් වටිනා චෙක්පත් තුනක් 2011 වර්ෂය වන විටත් කර්මාන්ත නිම නොකිරීම හේතුවෙන් අදාල පුද්ගලයන්ට ලබාදී නොතිබුණ අතර, කර්මාන්ත නිම කිරීමටද කටයුතුකර නොතිබුණි.

(ඉ) රු. 1,439,620 වියදමක් දරා කැබ් රථය අළුත්වැඩියා කර තිබුණද ඉන් පසුව විවිධ අවස්ථාවන් වල දී අළුත්වැඩියාවන් සිදුකර තිබූ බැවින්, එය නිසියාකාරව ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

**2.7 <u>අභ්‍යන්තර විගණනය</u>**

ආයතන තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3. <u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය